# අශෝක ඓතිහාසික විමර්ශනයක්


## පූජ්‍ය කොළොන්නේ රතනවීර හිමි


මෞර්ය වංශික අශෝකයන්ට භාරතීය ඉතිහාසයෙත් ලෝක ඉතිහාසයෙත් හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. මොහුගේ පාලන යුගය හැදෑරීමේදී බෞද්ධ සාහිත්‍යමය මූලාශ්‍රයනුත්, ශිලාලිපිත් ඉතා වැදගත් වේ. මින් ද වඩාත් වැදගත්වන්නේ අශෝකයන් විසින් පර්වතයන්හිත්, ටැම්වලත් කොටවන ලද ලේඛනයන්ය. මෙයට අමතරව බරබාර්හි ලෙන් ලිපි තුනක් ද දක්නට ලැබෙයි. මේ හැම ශිලා ලිපියකම දක්වෙන්නේ "දේවානම්පියදසි" යන රාජ නාමයයි. ක්‍රි. ව. 1337 දී ජේම්ස් ප්‍රින්සෙප් විසින් "පියදසි" යනුවෙන් හැඳින්වෙන්නේ අශෝකයන්ම බව සොයා ගත්තාට පසුව අශෝකගේ වැදගත් තොරතුරු රාශියක්ම ඉතිහාසයට එකතු වී ඇති බවක් දක්නට ඇත.

අශෝක පිළිබඳව බෞද්ධ මූලාශ්‍ර මගින් කරුණු සොයා බලන විට ලංකාවේ ආදි වංශ කථා දෙක වන දීපවංශය සහ මහාවංශයටත් හිමිවන්නේ වැදගත් ස්ථානයකි. ආගමික අංශයටම බර වූ මෙම වංශ කථාකරුවන් බෞද්ධාගමට අනුග්‍රහය දක්වන ලද අශෝකයන් ගැන පවසන තොරතුරු ඉතාමත්ම විමසිල්ලෙන් විභාග කළ යුතුව ඇත. මෙයට අමතර පුරාණ ග්‍රන්ථයනුත්, තාරානාථගේ ඉතිහාසයත් අශෝකගේ කාලය පිළිබඳව සෑහෙන තොරතුරු ලබාදේ.

අශෝක බින්දුසාර යුගයේදී උජ්ජයිනියේ ප්‍රාදේශික පාලකයා ලෙස කටයුතු කළ බව මහාවංශය සහ දීපවංශය දක්වයි. කෙසේ වුව ද බින්දුසාරගෙන් පසුව අශෝක රජ වූයේ අභ්‍යන්තරික සිවිල් අර්බුදවලට මුහුණ පෑමෙන් පසුව බව නිගමනය කිරීමට තරම් සාධක දක්නට ඇත. බින්දුසාර රජතුමා මියයන විට "සුසිම" නම් පුත්‍රයා රජ කරවීමට කැමැත්තක් දක්වූ බවත්, අමාත්‍යයන්ගේ මැදිහත්වීම නිසා එම තත්ත්වය මගහැරී අශෝකයන් රජ වූ බවත් දිව්‍යාවදානය දක්වයි. එහෙත් අශෝක රජ පැමිණියේ තම සොහොයුරන් එකුන් සියයක් මරා දැමීමෙන් පසුව බව මහාවංශය සහ දීපවංශය පවසත්. සොහොයුරන් සදෙනෙකු මැරීමෙන් පසුව අශෝක රජ පැමිණි බව තාරානාථ පවසයි. කෙසේ වුවත් මේ අනුව බලන විට අශෝක රජ පැමිණියේ අභ්‍යන්තරික සිවිල් අර්බුදවලදී සිහසුන අපේක්ෂා කළ කිහිප දෙනෙකු සමග තරග කිරීමෙන් පසුව බව නිගමනය කළ හැකිය. එහෙත් අශෝක සොහොයුරන් එකුන් සියයක් මරා දමා රජවීය යන මහාවංශ පුවත පිළිගැනීම එතරම් පහසු නැත. කලින් චණ්ඩ දාමරිකයකුව සිටි අශෝක බුද්ධාගමට හැරුණු විට සම්පූර්ණයෙන්ම වෙනස්වූ බව දක්වීමට වංශ කථාකරුවන්ගේ පරමාර්ථය විය.

අශෝක මුලදී බුද්ධාගම ඇදහූ අයෙකු නොවීය. කල් යාමේදී ඔහු බුද්ධාගමට හැරුණේය. මේ පිළිබඳව මත මතාන්තර රාශියක් ඇත. මහාවංශයත්, දීපවංශයත් කියනුයේ නිග්‍රෝධ නම් බෞද්ධ භික්ෂූන්වහන්සේ දැකීමෙන් තම අභිෂේකයෙන් සිවුවැනි වසරේ අශෝකයන් හදිසියේම බුද්ධාගම වැළඳගත් බවය. එහෙත් අශෝකයන් අභිෂේකයෙන් වර්ෂ 8 කට පසු කාලිංග යුද්ධය කළ බව විස්තරවීමෙන් අභිෂේකයෙන් වසර 4 කට පසු බුද්ධාගමට හැරුණේය යන මහාවංශයේ දක්වෙන පුවත පිළිගැනීමට අපහසු වේ. එසේ බුද්ධාගමට හැරී අශෝක ශාන්ත අයෙකු බවට පත්ව සිටියේ නම් ඉන්පසුව ඔහු කාලිංග යුද්ධය නොකරනු ඇත. තවත් වියතුන් පවසන්නේ කාලිංග යුද්ධය සමග හදිසියේ ඇති වූ මානසික විප්ලවයක් නිසා අශෝක බුද්ධාගම වැළඳගත් බවයි.

ගිර්නාර්හි 13 වැනි ලිපියේ සඳහන් වන පරිදි අශෝක තම අභිෂේකයෙන් 8 වැනි අවුරුද්දේ කාලිංග යුද්ධය කර ඇත. මෙම සටනින් ලක්ෂයක් පමණ මරුමුවට පත්වූ බවත්, එක්ලක්ෂපනස්දහසක් අනාථ වූ බවත්, මේ සිදුවීම් නිසා තමා තුළ චිත්ත සංවේගය ඇති වූ බවත් මෙම ලිපියේ අශෝක දක්වා ඇත. ගිර්නාර්හි 8 වැනි ලිපියේ සඳහන්ව ඇත්තේ තම අභිෂේකයෙන් වර්ෂ 10 කට පසු තමා සම්බෝධිය කරා ළඟා වූ බවය. මේ වන විට අශෝක බුද්ධාගම වැළඳගෙන අවසානය. බයිරාට් පර්වත ලිපියෙහි බුද්ධ, ධම්ම, සංඝ වෙත තමා තුළ තිබූ සීමාරහිත ලැදියාව සඳහන් කර ඇත. "කවුරුන් විසින් වුව ද සංඝයා භේද නොකළ යුතුය." යම් හෙයකින් භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ සංඝයා භේද කරන්නේ ද ඔහු හෝ ඇය සුදු වස්ත්‍ර පෙරවා ආශ්‍රමයෙන් පිටත් කළ යුතුය. මෙම ලිපිය මේ ශාසනයෙහි භික්ෂූන්ට මෙන්ම භික්ෂුණීන්ට ද ලියවන ලදී" යනුවෙන් සාරානාත් ටැම් ලිපියෙහි අශෝක ශිලා ලේඛන ගත කොට ඇත. සාංචි ටැම් ලිපියෙහි ද අශෝක මෙම අදහසම දක්වා ඇත. මේ කරුණු මත එක් නිගමනයකට එළඹිය හැකිය. එනම් අශෝක කාලිංග යුද්ධයෙන් පසුව ස්ථිරවම බෞද්ධයකු වී සිටි බවයි. තමා සියලු දෘෂ්ටිකයන් සියළුම ස්ථානයන්හි වාසය කරනු දක්නා කැමති බව අශෝක ගිරිනාර්හි 7 වැනි ලිපියේ සඳහන් කර ඇත. ඔහු නිරතුරුවම පෙන්නුම් කර ඇති අදහසක් වන්නේ ආගම් අතර අන්‍යෝන්‍ය සුහදතාවය සහ සහයෝගය වර්ධනය විය යුතු බවය.

අශෝක යුගයේ තුන්වැනි ධර්ම සංගායනාව ඇති වූ බව මහාවංශය දක්වයි. මෙයට හේතුව දුසිල්වත් අය

සමුත්ගතවීමෙන් ශාසනය පිරිහී යාම බවත් සඳහන් වේ. එහෙත් අශෝකගේ කිසිම ශිලා ලිපියක තමා එසේ සංගායනාවක් පැවැත්වූ බවක් සඳහන් කර නැත. එහෙත් මෙම හේතුව නිසා අශෝක කාලයේ සංගායනාවක් පැවැත්වූයේ නැතැයි තීරණය කළ නොහැක. තුන්වන ධර්ම සංගායනාවක් පිළිබඳව විස්තර පවසනුයේ දීපවංශය, මහාවංශය, සමන්ත පාසාදිකාව වංසත්තප්පකාසනී වැනි කෘතීන් අයත් වන ථෙරවාදී සම්ප්‍රදායයේ පමණක් බව කිව යුතුව ඇත. මහායානික සම්ප්‍රදායයේ මේ පිළිබඳව කිසිදු සඳහනක් දක්නට නැත. මේ නිසා මෙය ථෙරවාදීන්ට පමණක් විශේෂ වූ සංගායනාවක් ලෙස තීරණය කළ හැකිය. අශෝක තම ශිලා ලිපිවලින් පෙන්වා දී ඇත්තේ අන්‍යොන්‍ය සුහදතාවය සහ සහයෝගය වර්ධනය කළ යුතු හෙයිනි. බුද්ධ ශාසනයේ භේදයක් ඇති කිරීමට උනන්දු වූයේ යයි සිතීම අපහසුය. මේ අනුව නිගමනය කළ හැකිවන්නේ අශෝක සමයේ තුන්වන සංගායනාවක් පැවැත්වූ බවත්, ඒ සඳහා ඔහු පුරෝගාමීව කටයුතු නොකළ බවත්ය. ඔහු සංගායනාවට මුල්වී යයි පසු කලෙක වංශ කථාකරුවන් විසින් ගොඩනඟන ලද්දකැයි සිතිය හැකිය.

අශෝක රාජ්‍ය සමයේ අවසානය පිළිබඳව විවිධ පුරාවෘත්තයන් මහාවංශය, වංසත්ථප්පකාසනිය, අශෝකාවදානය වැනි කෘතීන්හි විස්තර වී ඇත. මෙම පුරාවෘත්තීන් විශ්ලේෂණය කර බලන විද්වත්හු අශෝකගේ රාජ්‍ය සමයේ අවසානයේ දී ඔහුගේ බලය සෑහෙන දුරකට දුර්වල වී ගිය බව පෙන්නුම් කරති.

අශෝක අධිරාජ්‍ය ව්‍යාප්ත වූ ආකාරය පිළිබඳව ඔහුගේ ශිලා ලිපිවල පිහිටීමෙන් සහ එම ශිලා ලිපිවල දැක්වෙන තොරතුරු පිරික්සීමෙන් සහ සාහිත්‍ය මූලාශ්‍ර ඇසුරෙන් ද දැක්වීමට පුලුවනි. ගිර්නාර්හි 5 වැනි ලිපියට අනුව අධිරාජ්‍යයේ කේන්ද්‍රස්ථානය පාටලීපුත්‍ර නගරය වූ බව පෙනේ. ගිරිනාර්හි 2 -13 වැනි ලිපිවලින් පෙන්නුම් කෙරෙන පරිදි අධිරාජ්‍යයේ දකුණු දෙසින් අසල්වැසියන් වූයේ චෝල, පාණ්ඩ්‍ය, කේරලපුත්‍ර සහ තාම්‍රපර්ණ යන ප්‍රදේශවල ජනතාවය. ඒ අනුව දකුණින් මයිසූරය දක්වාම අශෝක අධිරාජ්‍යය විහිදී ගියේය. නැගෙනහිරින් බෙංගාල බොක්කද, බටහිරින් අරාබි වෙරළද දක්වා අධිරාජ්‍ය ව්‍යාප්ත වී තිබුනි.

එච්. ජී. වෙල්ස් අශෝක ගැන අගය කලේ මෙසේය. "ලෝක ඉතිහාසයේ දස දහස් සංඛ්‍යාත නරපතීන් අතර අශෝකයන් තරු පිරිවරන ලද සඳක් මෙන් බැබළුනි" යනුවෙනි. ආගමික සේවය අතින් අශෝක රෝමයේ කොන්ස්ටන්ටයින් රජුට සමාන බව "රීස් ඩේවිස්" දක්වත්. ක්‍රිස්තු ධර්මයට ශාන්ත පාවුලු විසින් කරනු ලැබූ සේවයට හා සමාන සේවයක් අශෝකයන් විසින් බෞද්ධාගමට කරන ලද බව ඩී. ආර්. භණ්ඩාර්කාර් දක්වයි. ප්‍රාදේශික ආගමක්ව පැවැතිනි. බුද්ධාගම අශෝකයන් විසින් ලෝක ආගමක් බවට පත් කරන ලද බව බී. ඇම්. බරුවා මහතා දක්වයි.

මෙය මෙසේ වුවද සිය අධිරාජ්‍යයට පමණක් නොව පොදුවේ මනුෂ්‍ය සංහතියටම සේවය කිරීමට නැත් කරමින් එමෙන් ම ගතානුගතික දේශපාලන මතිමතාන්තර වලට සහ පාලකයින්ට පහර ගසමින් නව චින්තනයක් තුළින් භාරත දේශපාලන ක්ෂේත්‍රයේ මෙන්ම භාරත මනුෂ්‍යයන් තුළද මල්ඵල ගැන් වූ අශෝක අධිරාජයාගේ රාජ්‍ය සමය ක්‍රි. පූ. 232 දී පමණ අවසන් වුවද ඔහුගේ කීර්තිය ඉන් අවසන් නොවීය. එදත් අදත් අනාගතයේදීත් මානව ඉතිහාසය හදුරන්නෝ අශෝක අගය කරනු ඇත.